**ශීර්ෂය - 403 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩණ වාර්තාව 2021 ජූනි 30 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 21 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි .
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශය බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මුළු පුනරාවර්තන වියදම රු.19,012,387,668 ක් ලෙස දක්වා තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශනය අනුව එය රු.18,938,014,708 ක් ලෙස දක්වා තිබුණි. | මුළු එකතුව ලබා ගැනීමේ දී මුද්‍රණ දෝෂයකින් මුළු අගය වෙනස් වී ඇති බව | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

## 1.6.2 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.346,766,528 ක් ලෙස දක්වා තිබුණු අතර, භාණ්ඩාගාර මුද්‍රිත අනුව එය රු.558,107,895 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය නොවන වත්කම් හා දේපල පිරියත හා උපකරණ සංචිතයේ රු.211,341,367 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී CIGAS වැඩසටහන මඟින් නිසි පරිදි ගලපන ලද නිවැරදි මූල්‍ය නොවන වත්කම් ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | නිවැරදි ගිණුම් ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කල යුතු වීම. |

## 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද අත්තිකාරම් ගිණුම අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 20,034,214 ක් හා රු. 24,222,031 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම අගයන් පිළිවෙලින් රු. 24,222,031 ක් හා රු. 20,034,214 ක් ලෙස දක්වා තිබුණි. | සෑම මසකම අවසානයේ CIGAS පරිගණක දත්ත හා භාණ්ඩාගාර පිටපත් සැසඳීමෙන් පසු අමාත්‍යාංශයේ පාලන ගිණුම සකසනු ලැබේ. එම නිසා අත්තිකාරම් ගිණුමේ ලැබීම් වටිනාකම හා අමාත්‍යාංශයේ CIGAS පරිගණක අනුව ලැබීම් වටිනාකම වෙනස් වන බව. | අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් නිවැරදිව සටහන් කල යුතුවීම. |

## 1.6.4 අග්‍රිම ශේෂය

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව භාණ්ඩාගාර අග්‍රිම රු.988,762,787 ක් ලෙස දක්වා තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද අග්‍රිම ගිණුම අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.1,323,306,069 ක් වශයෙන් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.1,001,193,283 ක් වශයෙන්ද දක්වා තිබුණි. | සිගාස් සටහන් කිරීමේ දෝෂයක් පමණක් සිදුව ඇති බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව අග්‍රිම වටිනාකම ඇතුළත් කළයුතු වීම |
| (ආ) | ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2020 දෙසැම්බර් 31 දිනට අක්මුදල් ශේෂය රු.23,575,842 ක් වූ අතර, එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ හා අග්‍රිම ශේෂය යටතේ දක්වා නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදි බව | - එම - |
| (ඇ) | අක්මුදල් ගැලපුම් ගිණුමට අමාත්‍යාංශය විසින් 253 ශීර්ෂය වෙනුවෙන් දරන ලද වියදම් ලෙස රු.4,964,680 ක් හර කළ යුතු වුවත් රු.5,009,883 ක් හර කර තිබීම හේතුවෙන් අක්මුදල් ගැලපුම් ගිණුම රු.45,203 ක් වැඩියෙන් හර කර තිබුණි. | - එම - | අක්මුදල් නිවැරදිව ගැලපිය යුතු වීම |
| (ඈ) | අක්මුදල් ගැලපුම් ගිණුමට සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබී භාණ්ඩාගාරය වෙත පියවන ලද රු.12,430,496 ක් හර කර තිබීම හේතුවෙන් අක්මුදල් ගැලපුම් ගිණුම රු.12,430,496 ක් වැඩියෙන් හර කර තිබුණි. | - එම - | - එම - |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | පරිගණක ගතව පවත්වා ගෙන යනු ලබන බව. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය පවත්වා නොතිබුණි. | ඉදිරියේ දී ඇප ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳව ඇප ලේඛනය පවත්වා ගතයුතු වීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | දැනට වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන යන අතර, මුදල් රෙගුලාසි අනුව ලේඛනය පවත්වා ගෙන යාමට 2021 වර්ෂයේ සිට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතු වීම. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛන පවත්වා නොතිබුණි. | ඉදිරියේදී පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලබන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වීම |
| (ඉ) | මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව උප පත්‍රිකා ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනය පවත්වා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂයයන් 18 ක් සඳහා සලසා තිබුණු රු.50,630,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර, වැය විෂයයන් 25 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 99 දක්වා ඉතිරි වීම් පැවති බව නිරීක්ෂණය විය. | නඩත්තු අවශ්‍යතා මතු නොවීම කොරෝනා වසංගත තත්ත්වය තුළ අවම නිලධාරීන් ප්‍රමාණයක් සේවයේ නිරත වීම, කාර්යාලය වසා තිබීම, මිලදී ගැනීමේ අවශ්‍යතා මතු නොවීම හේතු වූ බව. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | වැය විෂයයන් 03 ක් සඳහා මු.රෙ.66 මඟින් මාරු කරන ලද රු.1,000,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | අක්මුදල් නොලැබීම, යවන ලද ප්‍රතිපාදන වියදම් නොකර ඉතිරි වීම, ප්‍රසම්පාදන කටයුතු සිදු කළ නොහැකි වීම යන කරුණු හේතු වූ බව. | අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන මාරු කල යුතුවීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂයයන් 48 කට අදාලව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල බැරකම් ප්‍රකාශයේ වටිනාකම රු.203,427,211 ක් වූ අතර, භාණ්ඩාගාරයට වාර්තා කරන ලද බැරකම් වටිනාකම රු.458,968,760 ක් වුයෙන් අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.255,541,549 ක වෙනසක් පැවතුණි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසා ලිපියක් යොමු කළ බව | බැඳීම් හා බැරකම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්වල දැක්විය යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය ප්‍රකාරව එළැඹෙන වර්ෂයේ අයවැය ප්‍රතිපාදන පිළිබඳව අවධානයක් යොමු නොකර සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 11 සඳහා රු.978,578,500 ක බැරකම් හා බැඳීම් ඇති කර ගෙන තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පැවති සංකීර්ණ විෂයය පථයක් මෙම අමාත්‍යාංශය යටතට ඇතුළත් කිරීම හේතුවෙන් අමාත්‍යාංශයට මෙම විෂයය පථයන් තුළ කටයුතු කිරීම පිළිබඳ අත්දැකීම් නොමැති වීම මත අධීක්ෂණ කටයුතු කළ නොහැකි වීම, සියලු බැඳීම් 2021 වර්ෂයේ මුල් මාස තුළ වාර්තා වීම යන අමාත්‍යාංශයට පාලනය කළ නොහැකි කරුණු මත ඇති වූ බව. | - එම - |
| (ඇ) | වැය විෂයයන් 15 ක රු.103,286,753 ක් වූ ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා රු.92,581,599 ක බැඳීම් හා බැරකම්වලට එළඹ තිබුණි. | - එම - | - එම - |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සකස් කිරීම සම්බන්ධ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2018 පෙබරවාරි 06 දිනැති අංක 05/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව ආයතනය විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. | - එම - | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතුය |

**3. මෙහෙයුම් සමාලෝචනය**
**-----------------------------**

**3.1 දැක්ම හා මෙහෙවර**
**----------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | ------------------------------------------ | ------------ |
| ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් ළමුන් හා කාන්තාවන් ආර්ථික, සමාජයීය හා අධ්‍යාපනික වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය නෛතික, ආයතනික, මානව සම්පත් සේවා හා යටිතල පහසුකම් සම්පාදනය කිරීම, වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කල ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කර නොතිබුණි. | ළමුන් අධ්‍යාපනික වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සම්බන්ධ අවධානය යොමු කිරිමේ දී ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් අනිවාර්ය අධ්‍යාපනය කඩවීම පිළිබඳව අධිකාරිය වෙත වාර්තා වූ පැමිණිලි සම්බන්ධව අවශ්‍ය මැදිහත්කරණය අවශ්‍ය අවස්ථාවලදී ලබා දී ඇති බව. | මෙහෙවරට අනුකූලව ක්‍රියා කිරීම සඳහා ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

**3.2 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය 2021 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති බව හා අමාත්‍යාංශයේ විෂයය පථය හා කාර්යය වෙනස් වීම මත 2021 සංවිධාන ව්‍යුහය වසර ආරම්භයේ දී සකස් කිරීමට නොහැකි වූ බව | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පොලිස් ළමා හා කාන්තා ඒකක ඉදිකිරීම් හා උපකරණ සැපයීම, දිවා සුරැකුම් හා ප්‍රජාපාදක සැදෑ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම, ජාතික පෙර පාසල් විෂයයමාලා ජාලයක් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සහ වෙරළබඩ ප්‍රදේශවල ළමයින්ට එරෙහිව ලිංගික සූරා කෑම වැලැක්වීම සඳහා තොරතුරු අධ්‍යාපනික සංනිවේදන ද්‍රව්‍ය සැලසුම් කිරීම හා සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.7,820,000 ක් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර, එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | ක්ෂේත්‍ර නිලධාරීන් මගින් වෙරළබඩ ප්‍රදේශවල සහය අවශ්‍ය දරුවන් හඳුනා ගැනීමෙන් පසුව සහය ලබාදිය හැකි ආයතන වෙත යොමු කිරීම හා මූල්‍ය ආධාර ලබා දිය හැකි මූලාශ්‍ර සම්බන්ධීකරණය කර ලබා දීම සිදු කර ඇති බව | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යභාරයන් ඉටු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැස්ම මඟින් උසස් පෙළ ගුරුවරුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ටැබ් පරිගණක 195,148 ක් නොමිලේ ලබා දීම සඳහා නිසි සැලසුම්කරණයකින් තොරව රු. මිලියන 5,000 ක ප්‍රතිපාදන වෙන් කරගෙන ජාතික තරඟකාරී ක්‍රමයට මිල ගණන් කැඳවා තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු දුර්වලතා හා ලංසු ඇගයීමේ දුර්වලතා හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය ප්‍රමාද වී තිබුණු අතර, මුල් අදියර යටතේ ටැබ් පරිගණක 96,919 ක් පාසල් වෙත සැපයීම සඳහා රු.මිලියන 3,008 ක මුදලකට 2019 සැප්තැම්බර් 30 දින ගිවිසුම්ගත වී තිබුණ ද 2021 සැප්තැම්බර් මාසය වන විටත් ටැබ් පරිගණක මිලදී ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | සැලසුම් කරන ලද කාර්යයන් නියමිත කාලය තුළ කාර්යක්ෂමව ඉටු කර ගත යුතු වීම |
| (ඇ) | ක්‍රීඩා පාසල් 16 ක් වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.78,400,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර, මුළු ප්‍රතිපාදනයම යොදවා පාසල් 11 ක පමණක් මෙම කාර්යය නිම කර තිබුණි. | වැඩවල ප්‍රමුඛත්වය සහ ලද ඇස්තමේන්තු වටිනාකම අනුව කළ යුතු වැඩ තීරණය කර ඇති බව හා වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මඟින් ඉතිරි පාසල්වලද වැඩ ඉටු කිරීමට පියවර ගනු ලබන බව. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර කාර්යභාරයන් සැලසුම් කළ යුතු වීම. |

## 3.4 ප්‍රසම්පාදනයන්

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් රු.3,500,000 ක් වැය කර කාන්තා ව්‍යවසායකයන් සඳහා ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් ( Digital Marketing Platform) නිර්මාණය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2, 6.3.1 (ඇ) හා 6.3.6 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 වන විට නිමකළ යුතු වුවද 2021 අප්‍රේල් 27 දින වන විටත් ක්‍රියාත්මක කළ හැකි පරිදි නිමකර නොතිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසු ලේඛන අමතර පිටපත් සහිතව ඉදිරිපත් කරන ලෙස අදාළ ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු අතර, සැලසුම් කරන ලද කාර්යයන් නියමිත කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2001 වර්ෂයේ දී රු.මිලියන 25 ක් වැය කර බියගම කාන්තා නේවාසිකාගාරයක් ඉදිකර තිබුණ ද 2020 අගෝස්තු 27 විගණන දින වන විටත් එම ඉඩම විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. |
| (ආ) අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වෙනත් අමාත්‍යාංශ සතු වාහන 05 ක් පවරා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පවරා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. |

**3.6 විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන 1938 කාන්තා දුරකතන සේවාව ශක්තිමත් කිරීමට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා සාර්ක් අරමුදලේ ප්‍රදාන මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ රු. 5,077,552 ක් වැය කර පරිගණක 15 ක් මිලදී ගෙන තිබුණි. එහෙත් මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කර නොතිබීම හේතුවෙන් මෙම පරිගණක විගණිත දින වූ 2021 අප්‍රේල් 30 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | සිදු වූ අපහසුතා හා සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේදයන් හේතුවෙන් නිලධාරීන් සීමිත වීම මෙම පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | විදේශාධාර ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යභාරයන් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ආ) ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළ උෂ්ණත්ව මාපක 1,400 ක් | තරඟකාරී මිල ගණන් මත ප්‍රසම්පාදනය සිදු කිරීම නිසා මිල ගණන් අඩු වූ බව | ණය ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල අරමුදල් උපරිම |

| | | |
|---|---|---|
| මිලදී ගැනීම සඳහා ලෝක බැංකු අනුමැතිය ලැබී තිබුණි. හදිසි අවශ්‍යතාවය මත සෘජු ප්‍රසම්පාදනය යටතේ ප්‍රසම්පාදනය කර ඒකකයක් රු.16,400 බැගින් උෂ්ණත්වමාපක 4,500 ක් රු.73,800,000 ක් වැය කර මිලදී ගෙන තිබුණි. දිවයින පුරා පෙර පාසල් වසා තිබුණ පසුබිමක හදිසි ප්‍රසම්පාදනය යටතේ ප්‍රසම්පාදන සිදු කර තිබුණ ද, භාණ්ඩ ලැබීමේ ප්‍රමාදයන් හා භාණ්ඩ බෙදා හැරීමේ ප්‍රමාදයන් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ දී තරඟකාරී මිල ගණන් මත තවත් උෂ්ණත්වමාපක 7,000 ක් සෘජු ප්‍රසම්පාදනය සිදු කල ආයතනයෙන්ම ඒකකයක් රු.6,250 බැගින් මිලදී ගැනීම නිසා ව්‍යාපෘතියට රු.45,675,000 ක අලාභයක් සිදු වී තිබුණි. | | කාර්යක්ෂමතාවයෙන්, ඵලදායීතාවයෙන් හා ආරථිකමය වශයෙන් උපරිම වාසි සහගත ලෙස වියදම් කළයුතු වීම |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගාල්ල රිච්මන්ඩ් විද්‍යාල භූමියේ ඉදි කර ඇති පුරා විද්‍යා ස්මාරකයක් ලෙස සැලකෙන සුවිශේෂී වාස්තු විද්‍යාත්මක වටිනාකම් ඇති ගොඩනැගිල්ලක් 2016 වර්ෂයේ අළුත්වැඩියා කිරීම සඳහා රු.5,461,979 ක් වැය කර තිබුණි. පුරා විද්‍යා ස්මාරකයක් වශයෙන් සැලකෙන මෙම ගොඩනැගිල්ලේ අළුත්වැඩියාවන් සිදු කළ යුතු ආකාරය පිළිබඳව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබුණ ද මෙම ගොඩනැගිල්ල විනාශ වීමේ තර්ජනයට ලක් වී ඇති බව නිරීක්ෂණය විය. | දකුණු පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගෙන මෙම වැඩය නිම කිරීමට පියවර ගෙන ඇති බව. | පුරා විද්‍යා ස්මාරකයක් ලෙස සැලකෙන සුවිශේෂී වාස්තු විද්‍යාත්මක වටිනාකම් ඇති ගොඩනැගිල්ලක් බැවින් අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වීම |